# අම්මේ ඔබ ළඟට එමී

කිරි කර ඇගේ ලෙය පොවමින් අපමාන
දරු සෙනෙහසින් ඇඟ කැත කුණු තවරාන
දැඩි කළ දූ පුතුන් හද පිරී අභිමාන
අම්මේ ඔබයි මතු මෙත් බුදු සම්දාන

තරු කැළ දිලෙන අහසෙහි කළ නොහැක ගණන්
වැලි කැට පොළොව මත සීමිත නොමැති තරන්
සයුරෙහි ජලය මැන කිව හැකි නොවෙයි ගැලුන්
මව් සෙනෙහසත් ඒ ලෙස කල නොහැක මිණුම්

දිව රෑ නැතිව දරුවන් යහපත මත්තේ
සැම දුක් තැවුල් සතුටිනි ඇය විඳ ගත්තේ
තම දිවි ලෙසින් දරුවන් සැම රැක ගත්තේ
අම්මා වැනි කෙනෙක් වෙන නැහැ මිහි මත්තේ

දනට පිනට නිතරම බැතියෙන් ලැදිව
හැමහට දයා කරුණාවෙන් ලෙන්ගතුව
නිවුණා මගේ ලොව එළි කල පන්සිළුව
ගනඳුර අතර තනිවිය මම අසරණව

ඔබ ගිය මගම මම තව ඉදිරියට යමි
දැල්වෙන පහන සිතිජයෙ ඔබ බව දනිමි
දිනයක් ගානේ මග කෙටි වන බව දනිමි
තව ටික දුරයි අම්මේ ඔබ ළඟට එමී

-සරත් වීරසේකර- කැනඩාව

# පහන් වැට

## ලේ

මගේ පෑනෙන්
ගලන්නේ ලේ..

සුරුවම පෙනෙන
මානෙක..
ගසා ඇණ
අත් පා බැඳ..
ගිනිමැලය ළඟ
තනිකළ..
මිනිසෙකුගෙ
සිරුරත ලේ..

බුදුන් බුදු වුණ
උදැහැන..
හිරු එන්ට පෙර
විල්තෙර..
ඊ තුඩු ඇ,
මියැදුණ..
හංසයෙකු ගත
රැඳි ලේ..

බෝ දුර ගෙවා
පැමිණෙන..
වීදි කෙළවර
වැතිරෙන..
බලූ දිවක් මෙන්
හතිලන..
සමනල වතක
වැකි ලේ..

ලේ පැහැවෙත
අහස..
හොවා දෙදණම
මිහිමත..
මැරෙන මලකට
පෙම්කළ..
මිනිසෙකුගෙ
හදවත ලේ..

මගේ පෑනෙන්
ගලන්නේ ලේ..

රසික ජයකොඩි

## ඉමහත් ශෝකයෙනි

(හමුදා ජෙනරල් ට සහාය දීමට ජවිපෙ එකඟ වෙයි - පුවතක්)



අප්‍රේල් විරුවනි නැගිටිනු
ඉල්මහේ විරුවනි නැගිටිනු
හිස්වලට ගසා ලූ
පරාල ඇණත් ගලවනු
ටයර් සෑයේ අඟුරු ඇටකටු
පෝස්ටර් ලියන්නට අරගනු

පා ඇඟිලි වලින් එල්ලා
එස්ලොන් බටයෙන් ගැසූ සලකුණු
ආදරෙන් අමතක කරලමු
ගුද මාර්ගේ කම්බි කටු
දෑතින්ම සීරුවෙන් ගලවමු

පක්ෂයේ වැටුනු රතු ධජය
ජෙනරාල් ඔසවනු ඇති
සැමදෙන එකම තැන රැඳෙන
සම බිම
නුඹ දිවි පුදා ලූ සිහිනය
ජෙනරාල් අපට දෙනු ඇති

හෙට අරුණෝදයේ
ජෙනරාල් වෙනුවෙන්
කඩේ යන්නට
පක්ෂයට
සහෝදරවරුන්ගේ ශක්තිය
කවදාටත් වැඩිය අද
උවමනා කර තිබෙන මොහොතේ
අතීතය අමතක කර
දැන් ඉතින්......
මරණයෙන් නැගිටිනු !

(ඉමහත් ශෝකයෙනි )

තුසිත් අබේනායක



## අවලංගු කාසිය

අවලංගු කාසියකි මම
එහෙ මෙහෙ අත දුවන
වලංගු නොවුණෝ කිම
නෙක නෙක තැන විසිර

ඔය පසුම්බියේ තනියට
දිලි දිලී වැඩ විසූවට
අත්‍යාවශ්‍ය මොහොතකට
එලක් තියේද වැඩක් නැතිකොට

ඇති මුත් වෙනත් රට කොළ
දැනුනිද මගෙත් වගතුග
නොහැකිය තවත් රිදෙන්නට
වලංගුද හෙටටවත් මම

අංජන ජයවීර



## නිහඬ පෙම් කවක්

ලියන්නට හැකිනම්
නුඹට මෙන්
මුමුණමින්
පන්හිඳක් පුරාවට
ගලා එන සිතුවිළි ගඟුළ
කෝ කොහේ සැඟවුනිද
ඇරඹුමක් අවසනක්
නොතබාම
සිදී යන ඉක්මන

හෙට යැයි හැඟෙන
මෙවන් වූ
තව දිනෙක
කවි හිතට පෙම් බඳින
නුඹ
එනවාද මේ පැත්තේ
ඒත් මට ඇහේවිද
පා ගැටෙන
අඩි සද්දේ

මුව අයා සිටින්නේ
පදින් පද අමුණමින්
නුඹ කියන
පෙම් කවේ
අරුත් බර වදන් වී
ලොවට රස
බෙදන්නට
ඒත් මට ඇහේවිද

නොමදුටු නෙක පාට
රුව ඇතිලූ කදිම මල්
කිනිත්තක් නැතිවාට
කමක් නැත
මලක් යැයි හැඟෙන
ගත වෙලී හමා යන
හදේ රැඳි
සුවඳ බිඳ සැහේය
පිපි එන හිත් මලට

හිරු සඳුද නොදකිනා
එතැයි දෝ සාංකා
මා සිටින ඉසව්වේ
ලිපිනයයි මේ
ඇස ගැටෙන මායිමක
සුරැකිවම
තබා ගන්න
"නාඳුනනා හිතවතිය"
අඳ බිහිරි ගොළු මඩම

කේ නයනා එල් පෙරේරා
ගැබරෝන් බොට්ස්වානා




## යුද්ධයට යුද්ධයක්

නෙලපු මල් අරගෙන අතින්
සමාකරගෙන
කරපු පව් කැළණියෙන්
මුදා බඳ පටි
දන් දෙමින් තරුපටි
දණ ගසත් ගජිඳෝ
විලිස්සා දත්
දිමුතු පැහැපත්

නිල්පාටම උණත්
ඉහ උඩින් අහස තවමත්
උදේ හවසට ජේන
පල්ලූව තද රතුයි කොහොමත්

පැලවුනු
බිම්බෝම්බ ගස්වල
හැදේවිද හෙට
මොන මොන වගේ පලවැල
උඩගෙඩි කොහොම කැඩුවත්
වැටෙන කොට බිම
පළු දෙපළු වෙන් වෙත්

ජීවිතය ගඟුලක්ව
ගැලිය යුතුමය
පෙණ නගා ගයමින
ඒ නිසයි මේ ගල්ගෙඩි
වැටෙන්නේ ඉහල ඉඳ
ගලන ගංගා වලට පහලට

පරූ වුනත් කහටකි
නොහේදෙයි නොවෙයි පිරි සුදු
කොහොම ගැහුවත් ගල උඩ
රෙදි පෙරෙදි ගලවා නිරුවතින්
පොඟ පොඟා වැගිරෙන සුළු
දියෙන්

ගල් උඩම පහරන බලල්
අත්වල සුවඳ ඇත
නැතත් නියපොතු
පෙරලෙති තල තලා කැකුණෑට
සූකර පැටව් හිනැහෙත

පැත්ත ඇලවුනු
කුරිසියකි කතිරය
පෝලිමේ ගොස්
සීරුවෙන්
අප අපිම ඇණ ගහන
මේ කොහොම බැළුවත් ඉතින්
මලගිය උන් විතරමයි දිනුම්

-රන්සිරිමල් ප්‍රනාන්දු-